සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II | පැය තුනයි |
| குடியியற் கல்வி | I, II | மூன்று மணித்தியாலம் |
| Civic Education | I, II | Three hours |

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි:**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ප්‍රධාන කොටස් තුන අනුපිළිවෙළින්,
(1) විධායකය, ව්‍යවස්ථාදායකය හා අධිකරණයයි.
(2) ව්‍යවස්ථාදායකය, විධායකය හා අධිකරණයයි.
(3) අධිකරණය, විධායකය හා ව්‍යවස්ථාදායකයයි.
(4) විධායකය, අධිකරණය හා ව්‍යවස්ථාදායකයයි.

**2.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කරනු ලබන්නේ,
(1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසිනි.
(2) මැතිවරණ කොමිෂන් සභාව විසිනි.
(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි.
(4) පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවක් විසිනි.

**3.** කිසිදු වෙනස්කමකට භාජනය නොකොට අයිතිවාසිකම් හා නිදහස භුක්ති විඳීමට ඉඩ සැලසීම හඳුන්වන්නේ පහත සඳහන් කවර නමකින් ද?
(1) සමානාත්මතාව
(2) යුක්තිය
(3) නීතිය
(4) සදාචාරය

**4.** බහු පක්ෂ ක්‍රමයක් ඇති රටවල් දෙකක් නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) මහා බ්‍රිතාන්‍යය, මැලේසියාව
(2) ශ්‍රී ලංකාව, ඉන්දියාව
(3) ජර්මනිය, ප්‍රංශය
(4) ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව

**5.** පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය වන්නේ,
(1) ජනාධිපතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයයි.
(2) කථානායකවරයා ඇතුළු ආණ්ඩු පක්ෂ මන්ත්‍රී කණ්ඩායමයි.
(3) අගමැතිවරයා ඇතුළු අමාත්‍ය මණ්ඩලයයි.
(4) ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයායි.

**6.** රාජ්‍යයේ කැමැත්ත හා මහජන අපේක්ෂා ක්‍රියාවට නංවන නියෝජිතයා ලෙස සැලකෙන්නේ,
(1) ජනාධිපතිවරයායි.
(2) අග්‍රාමාත්‍යවරයායි.
(3) කථානායකවරයායි.
(4) ආණ්ඩුවයි.

**7.** යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍ය දෙක ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) එංගලන්තය හා ජර්මනිය
(2) ස්පාඤ්ඤය හා ඉතාලිය
(3) ඕලන්දය හා පෘතුගාලය
(4) එංගලන්තය හා ප්‍රංශය

**8.** ඇමෙරිකා එක්සත් ජනපදයේ සන්ධීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මධ්‍යම රජයට බලතල අයත්වන විෂයයන් දෙකක් වන්නේ,
(1) අධ්‍යාපනය හා සෞඛ්‍යය ය.
(2) බදු පැනවීම හා විදේශ වෙළඳාම ය.
(3) නිවාස හා ඉදිකිරීම් ය.
(4) පළාත් පාලනය හා මහාමාර්ග ය.

[දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

9. ශ්‍රම සූක්ෂ්ම ශිල්පීය ක්‍රම භාවිතය යනුවෙන් අදහස් කෙරෙනුයේ,
   (1) භාණ්ඩ නිෂ්පාදනයේ දී යාන්ත්‍රික ශ්‍රමය බහුලව යොදා ගැනීම ය.
   (2) භාණ්ඩ බෙදා හැරීමේ දී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීම ය.
   (3) භාණ්ඩ නිෂ්පාදනයේ දී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීම ය.
   (4) භාණ්ඩ ප්‍රචාරණය සඳහා විවිධ තාක්ෂණික උපක්‍රම භාවිත කිරීම ය.

10. පාරිභෝගික භාණ්ඩයක් හා අන්තර් භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ආහාර ද්‍රව්‍ය, ඖෂධ
   (2) යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ
   (3) ඇඳුම් පැළඳුම්, පොහොර
   (4) ගොඩනැගිලි, සිමෙන්ති

11. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය හා ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධකවලට කරන ගෙවීම් පිළිවෙළින්,
   (1) වැටුප, පොළිය, බදු කුලී හා ලාභාංශ වේ.
   (2) ලාභාංශ, බදු කුලී, පොළිය හා වැටුප වේ.
   (3) බදු කුලී, වැටුප, පොළිය හා ලාභාංශ වේ.
   (4) ලාභාංශ, බදු කුලී, වැටුප හා පොළිය වේ.

12. පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීම මූලික ලක්ෂණයක් වන්නේ,
   (1) ධනවාදී අර්ථ ක්‍රමවල ය.
   (2) සමාජවාදී අර්ථ ක්‍රමවල ය.
   (3) මිශ්‍ර අර්ථ ක්‍රමවල ය.
   (4) පරිවර්තන අර්ථ ක්‍රමවල ය.

13. බහු සංස්කෘතික සමාජයක යහ පැවැත්මට **බාධාකාරී** වන ලක්ෂණයක් වන්නේ,
   (1) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම ය.
   (2) සෑම විටම අන්‍ය සංස්කෘතීන්ට වඩා තම සංස්කෘතිය උසස් බව සලකා කටයුතු කිරීම ය.
   (3) ජාති, ආගම් භේද නොසලකා කටයුතු කිරීම ය.
   (4) අන්‍ය ජාතීන්ගේ භාෂා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ය.

14. පළාත් සභා ක්‍රමය යටතේ මධ්‍යම රජය හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදු කරන නියෝජිතයා වන්නේ,
   (1) පළාත් ආණ්ඩුකාරවරයා ය.
   (2) මහ ඇමතිවරයා ය.
   (3) පළාත් ප්‍රධාන ලේකම්වරයා ය.
   (4) පළාත් සභා සභාපතිවරයා ය.

15. දේපළ අයිතිය පෞද්ගලික අංශය සතුවීම හා ලාභය පෙරදැරි කරගෙන ආර්ථික කටයුතු සිදු කරන අර්ථ ක්‍රමය,
   (1) වෙළෙඳපොළ අර්ථ ක්‍රමයයි.
   (2) මිශ්‍ර අර්ථ ක්‍රමයයි.
   (3) සමාජවාදී අර්ථ ක්‍රමයයි.
   (4) ධනවාදී අර්ථ ක්‍රමයයි.

16. පළාත් පාලන ආයතනවලට අයත් පොදු උපයෝගිතා සේවා යටතට ගැනෙන කාර්යයක් වන්නේ,
   (1) මහජන වැසිකිළි ඉදි කිරීම හා අලුත්වැඩියා කිරීම ය.
   (2) පොදු මංමාවත් ඉදි කිරීම හා නඩත්තු කිරීම ය.
   (3) මහජන වෙළෙඳපොළ පවත්වාගෙන යාම ය.
   (4) මළාපවහන පද්ධති ක්‍රමවත්ව පවත්වාගෙන යාම ය.

17. නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය අයත් වන මානව හිමිකම් කාණ්ඩය වන්නේ,
   (1) ආර්ථික හා සිවිල් අයිතිවාසිකම් ය.
   (2) මානව හා සංස්කෘතික අයිතිවාසිකම් ය.
   (3) දේශපාලන හා ආර්ථික අයිතිවාසිකම් ය.
   (4) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ය.

18. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අදාළ මූලධර්මයක් වන්නේ මින් කුමක් ද?
   (1) ළමයාගේ නිදහස ආරක්ෂා කිරීම
   (2) ළමයාගේ උපරිම යහපත සැලසීම
   (3) ළමයාගේ අධ්‍යාපනය සහතික කිරීම
   (4) ළමයාගේ සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම

19. යුතුකම් කොටස් දෙකකට බෙදේ. ඉන් එකක් සදාචාරාත්මක යුතුකම් ලෙස සැලකේ. අනෙක් යුතුකම් කොටස වන්නේ,
   (1) ආගමික යුතුකම් ය.
   (2) සමාජයීය යුතුකම් ය.
   (3) නීතිමය යුතුකම් ය.
   (4) පුරවැසි යුතුකම් ය.

20. ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූයේ,
   (1) 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   (2) 1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   (3) 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.
   (4) 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගිනි.

21. අභියාචනාධිකරණය සතු බලතල පළාත් මට්ටමින් විමධ්‍යගත කිරීමේ අරමුණින් පිහිටුවනු ලැබූ අධිකරණය වන්නේ,
   (1) මහේස්ත්‍රාත් අධිකරණයයි.
   (2) දිසා අධිකරණයයි.
   (3) මහාධිකරණයයි.
   (4) පළාත්බද මහාධිකරණයයි.

[කුන්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**22.** රටක පාලනය නීතියේ උත්තරීතරභාවයට අනුව සිදු කිරීම හඳුන්වන්නේ,
(1) නීතියේ ආධිපත්‍යය යනුවෙනි. (2) අධිකරණයේ ස්වාධීනත්වය යනුවෙනි.
(3) ස්වාධිපත්‍යය යනුවෙනි. (4) ප්‍රජාතන්ත්‍රවාදය යනුවෙනි.

**23.** ශ්‍රී ලංකාවේ වාර්ෂික අයවැය පාලනය සිදු කෙරෙනුයේ,
(1) මුදල් අමාත්‍යවරයා විසිනි. (2) ව්‍යවස්ථාදායකය විසිනි.
(3) ශ්‍රී ලංකා මහ බැංකුව විසිනි. (4) ජනාධිපතිවරයා විසිනි.

**24.** සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතියට අනුව,
(1) වරදකරුවෙකුට මරණ දඬුවම වෙනුවට වෙනත් විකල්ප දඬුවමක් ඉල්ලා සිටිය හැකි ය.
(2) අතීතයට බලපාන අයුරින් පනවන දඬුවම්වලින් මිදී සිටිය හැකි ය.
(3) ළමයින් පැහැරගෙන යාමට හෝ බලහත්කාරයෙන් රඳවා තබා ගැනීමට විරුද්ධව දඬුවම් පැමිණවිය හැකි ය.
(4) තම රටේ යුක්තිය පසිඳලීමෙන් සෑහීමකට පත්නොවේ නම් මානව හිමිකම් කඩවීම් පිළිබඳව මානව හිමිකම් කමිටුවට පැමිණිලි කළ හැකි ය.

**25.** ගැටුමක් නිරාකරණයේ දී 'ජය-ජය විසඳුම්' ලබා ගැනීමට යොදා ගත හැකි පහසුම ක්‍රමවේදය වන්නේ,
(1) සාකච්ඡා ක්‍රමයයි. (2) කේවල් ක්‍රමයයි. (3) සහමන්ත්‍රණයයි. (4) මැදිහත්කරණයයි.

**26.** පුරවැසියකු විසින් ඉටු කළ යුතු නීතිමය යුතුකම් දෙකක් වන්නේ,
(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම හා පරිසරය සුරැකීමයි.
(2) ත්‍රස්තවාදය පිටුදැකීමට ක්‍රියා කිරීම හා ජාතික උරුමයන් හා ජාතික සම්පත් සුරැකීමයි.
(3) රජය විසින් පනවන බදු ගෙවීම හා පොදු දේපළ ආරක්ෂා කිරීමයි.
(4) පූජක උතුමන්ට ගරු කිරීම හා වැඩිහිටියන්ට සැලකීමයි.

**27.** ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට මුහුණපෑමට සිදුව ඇති **අහිතකර** බලපෑමක් වන්නේ,
(1) අකාර්යක්ෂම කර්මාන්ත වෙළෙඳපොළෙන් ඉවත් වීමයි.
(2) බුද්ධිගලනය වේගවත් වීමයි.
(3) විවිධ කලාපීය සංවිධාන හා එකතු වීමට හැකි වීමයි.
(4) විදේශ ආයෝජන හා තාක්ෂණය ගලා ඒමයි.

**28.** වෘත්තීය ක්ෂේත්‍රය තුළ සේව්‍ය සේවක දෙපක්ෂය අතර ගැටුම් ඇති වූ විට ප්‍රජාතන්ත්‍රවාදීව ආරවුල් විසඳා ගැනීමට බහුලව භාවිත කරන ක්‍රමයක් වන්නේ,
(1) සාකච්ඡා ක්‍රමයයි. (2) සමථකරණයයි. (3) මැදිහත්කරණයයි. (4) කේවල් කිරීමයි.

**29.** පළාත්බද අධිකරණය සතු බලතල දෙකක් දැක්වෙන පිළිතුර තෝරන්න.
A - වාණිජ ආරවුල් විසඳීම
B - රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ පිළිබඳ නඩු විසඳීම
C - කම්කරු විනිශ්චය සභා තීරණ පිළිබඳ නඩු විසඳීම
D - පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීම
E - ස්ත්‍රී දූෂණ පිළිබඳ නඩු විසඳීම
(1) A හා B (2) A හා C (3) B හා E (4) C හා D

**30.** අධිකරණ සේවා කොමිසමේ සභාපති ධුරය දරනු ලබන්නේ,
(1) අග්‍රවිනිශ්චයකාරවරයා ය. (2) සොලිසිටර් ජනරාල්වරයා ය.
(3) නීතිපතිවරයා ය. (4) අධිකරණ ආමාත්‍යාංශයේ ලේකම් තුමා ය.

**31.** බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අතුරෙන් ප්‍රථමවරට ලාංකිකයින්ට දේශපාලන මැදිහත්වීමකට වැඩි අවස්ථාවක් උදා වූයේ පහත සඳහන් කවර ප්‍රතිසංස්කරණය මගින් ද?
(1) 1833 කෝල්බෲක් - කැමරන් (2) 1910 කෲව් - මැකලම්
(3) 1921 මැනිං (4) 1931 ඩොනමෝර්

**32.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.
- මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ප්‍රථමවරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම
- ශ්‍රී ලංකාවේ අවසාන ම හා ඉහළ ම උසාවිය ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය පිළිගැනීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයක් පිහිටුවීම

මෙම වෙනස්කම් සිදු කරන ලද්දේ කවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?
(1) 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව (2) 1947 සෝල්බරි ව්‍යවස්ථාව
(3) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව (4) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව

[හතරවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

**33.** "කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය අගින් කෙළවර විය යුතු ය."
- හැරල්ඩ් ජේ. ලැස්කි

මානව හිමිකම් සම්බන්ධව ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ,
(1) මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ දී ආබාධිත පුද්ගලයින්ට අනෙක් අය උපකාර කළ යුතු බව ය.
(2) තවත් අයෙකුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වන අයුරින් අයිතිවාසිකම් භුක්ති විඳීමට කිසිවෙකුටත් අයිතියක් නැති බව ය.
(3) ඕනෑම අයෙකුට සැරයටියක් වනමින් වුව ද පාරේ ගමන් කිරීමට අයිතියක් ඇති බව ය.
(4) පුද්ගලයෙකුට මානව හිමිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් සීමා පැනවිය නොහැකි බව ය.

**34.** මානව සංවර්ධන දර්ශකයට අයත් නිර්ණායක වන්නේ,
(1) ආයු අපේක්ෂාව, සාක්ෂරතාව හා ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයයි.
(2) ආයු අපේක්ෂාව, මාතෘ මරණ අනුපාතිකය හා සාක්ෂරතාවයි.
(3) ළදරු මරණ අනුපාතිකය, සාක්ෂරතාව හා ආයු අපේක්ෂාවයි.
(4) ආයු අපේක්ෂාව, දළ මරණ අනුපාතිකය හා ක්‍රය ශක්තිය මත ගැළපූ ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතයයි.

**35.** බෙංගාල බොක්ක මුහුදු තීරයට අයත් රටවල් එක්ව කාර්මික හා ආර්ථික සහයෝගීතාව සඳහා පිහිටුවාගත් 'බිම්ස්ටෙක් (BIMSTEC)' සංවිධානයට අයත් රටවල් දෙකක් වන්නේ,
(1) ශ්‍රී ලංකාව හා සිංගප්පූරුවයි. (2) බංග්ලාදේශය හා ඉන්දුනීසියාවයි.
(3) ඉන්දියාව හා මැලේසියාවයි. (4) මියන්මාරය හා තායිලන්තයයි.

**36.** සංවර්ධිත රටවල දක්නට ලැබෙන ඇතැම් ලක්ෂණ සංවර්ධනය වෙමින් පවතින ශ්‍රී ලංකාවේ ද දක්නට ඇත. ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන එවැනි ලක්ෂණ දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ඉහළ මානව සංවර්ධන දර්ශකය හා අඩු ජන සංඛ්‍යා වර්ධනය
(2) අධික නාගරික ජනසංඛ්‍යාව හා අඩු ළදරු මරණ අනුපාතිකය
(3) ඉහළ ආයු අපේක්ෂාව හා ඉහළ සාක්ෂරතා මට්ටම
(4) ඉහල අධ්‍යාපනික වියදම හා අඩු මාතෘ මරණ අනුපාතිකය

**37.** දකුණු හා අග්නිදිග ආසියා රටවල ආර්ථික හා සමාජයීය අභිවෘද්ධිය සඳහා 1950 දී ඇති කර ගන්නා ලද සාමූහික සැලැස්ම හඳුන්වනු ලබන්නේ පහත සඳහන් කවර නමකින් ද?
(1) ආසියාන් සංවිධානය (2) කොළඹ ක්‍රමය
(3) පොදුරාජ්‍ය මණ්ඩලය (4) සාර්ක් සංවිධානය

**38.** ග්‍රාමීය ජනතාවගේ පෝෂණ හා ජීවන මට්ටම ඉහළ නැංවීම හා කෘෂිකාර්මික ඵලදායීතාව වැඩි දියුණු කිරීම සඳහා මැදිහත් වීම යන අරමුණු මුල්කරගත් එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතනය වන්නේ,
(1) ආහාර හා කෘෂිකර්ම සංවිධානයයි (F.A.O). (2) ලෝක ආහාර වැඩසටහනයි (W.F.P).
(3) ලෝක සෞඛ්‍ය සංවිධානයයි (W.H.O). (4) ලෝක බැංකුවයි.

**39.** තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ දී ඉටු කරගත යුතු සමාජයීය අවශ්‍යතා දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.
A - ලාභය උපරිම කර ගැනීමේ නිෂ්පාදන ආකල්ප පාලනය
B - වෙළෙඳපොළ පුළුල් වීම නිසා ඇති වන තරගය පාලනය
C - මූලික මිනිස් අවශ්‍යතා ඉටු කර ගැනීම
D - පරිසර හිතකාමී සම්පත් පරිහරණය
E - සාධාරණත්වය ඉටු කර ගැනීම
(1) A හා B (2) B හා C (3) C හා E (4) D හා E

**40.** එක්සත් ජාතීන්ගේ ප්‍රධාන පරිපාලන ආයතනය වන්නේ,
(1) මහාමණ්ඩලයයි. (2) ජාත්‍යන්තර අධිකරණයයි.
(3) භාරකාර මණ්ඩලයයි. (4) ලේකම් කාර්යාලයයි.

* *

[පස්වැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

62 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II |
| குடியியற் கல்வி | I, II |
| Civic Education | I, II |

## පුරවැසි අධ්‍යාපනය II

* **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
* **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1.** (i) 'ඇතැන්ස්' පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූ පුරවැසි සභාවේ කටයුතුවලට සහභාගි වීමට අවසර **නොලැබූ** පුද්ගලයන් **දෙකොටසක්** නම් කරන්න.

(ii) නීතියේ ආධිපත්‍යය සහිත සමාජයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iii) ස්විට්සර්ලන්තයේ සන්ධීය ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(iv) රටක ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට බලපෑ හේතු **දෙකක්** සඳහන් කරන්න.

(v) කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා රජය සම්මත කර ඇති පනත් **දෙකක්** නම් කරන්න.

(vi) මිනිස් ක්‍රියාකාරකම් නිසා වර්තමානයේ ලෝකය මුහුණ පා සිටින පාරිසරික ගැටලු **දෙකක්** සඳහන් කරන්න.

(vii) සම්පත්වල ඵලදායිතාව දියුණු කිරීමට ලෝකයේ භාවිත වන උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(viii) ගැටුම් නිරාකරණය සඳහා යොදාගනු ලබන සාකච්ඡා ක්‍රමයේ මූලික ගති ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(ix) රටක සමාජ සාධාරණත්වය බිඳවැටීමට බලපාන හේතු **දෙකක්** ලියන්න.

(x) තානාපතිවරුන් හා රාජ්‍ය දූතයන් තුළ තිබිය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 02 × 10 = 20 යි)

**2.** (i) ශ්‍රී ලංකාවේ මැතිවරණයක දී හෝ ජනමත විචාරණයක දී හෝ ඡන්දදායකයකු වීම සඳහා පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) "ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථක වීම කෙරෙහි ඡන්දදායකයා සතු වගකීම ඉතා වැදගත් වේ." කරුණු **තුනක්** ඇසුරෙන් මේ බව පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

**3.** (i) ශ්‍රී ලංකාවේ දිසා අධිකරණයට විභාග කළ හැකි නඩු වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) නීතිපතිතුමාගේ කාර්යයන් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** සඳහන් කර, ඒවායේ ඇති වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 05 යි)

**4.** (i) ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමෙහිලා බලපාන සාධක **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) කිසියම් රටක් ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු **තුනක්** ලියන්න. (ලකුණු 03 යි)

(iii) ජාත්‍යන්තර සම්බන්ධතා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති කරන බලපෑම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

[හයවැනි පිටුව බලන්න.

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/

5. (i) මිනිසාගේ පැවැත්ම සඳහා වූ මූලික අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඕනෑම අර්ථ ක්‍රමයකට මුහුණ පෑමට සිදු වන මූලික ආර්ථික ප්‍රශ්න **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) වෙළෙඳපොළ අර්ථ ක්‍රමවල දක්නට ඇති විවිධ ස්වරූප **දෙකක්** සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළෙඳපොළ අර්ථක්‍රමයේ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

6. (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පළාත් පාලන ආයතනවල ප්‍රයෝජන **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) ශ්‍රී ලංකාවේ මධ්‍යම ආණ්ඩුව, පළාත් සභා සහ පළාත් පාලන ආයතන කෙරෙහි පුරවැසියාගෙන් ඉටු විය යුතු යුතුකම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

7. (i) පාරිසරික ගැටලු ඇති වීම කෙරෙහි බලපාන ස්වාභාවික සංසිද්ධි **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාව කසල කළමනාකරණයේ දී මුහුණපාන ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (a) මෙරට කසල කළමනාකරණය සඳහා මෑතක දී රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** සඳහන් කරන්න.

(b) ශ්‍රී ලංකාවේ කසල පිළිබඳ ගැටලුව විසඳීම සඳහා පුරවැසියන් සහාය විය යුතු ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න.

(ලකුණු 05 යි)

***

Download all Past Papers : https://bookbeekid.com/resource/past-papers/